www.agaram.lk

90016

AL/2018/71/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

සිංහල I
சிங்களம் I
Sinhala I

71 S I

2018.08.11 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

● පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** (අ) සතරමහමුහුද පැන් විතරටත් බොහෝව' යනාදීන් අනමතග්ගපරියාය සූත්‍රය වදාරත් වදාරත් මුවාත් තබන යකඩෙක මලකඩ ඉගිලෙන්නා සේ ශෝකදුඃඛය තුනී විය. ශෝකදුඃඛය තුනී නියාව දැනලා බුදුහු පටාචාරාවන් බණවාලා 'හෙම්බා පටාචාරාවෙනි, දෙමව්පිය ආදීහු මිය පරලොව යන්නවුන්ට තුමූ ජීවත් ව හිඳත් පිහිට විය නොහෙති. නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොටගෙන තමතමන්ට පිහිට වියයුතු ය'යි වදාරා විසිවන මග්ගවග කෙළවර ගාථා දෙකකින් බණ වදාළසේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළොව පස් විතරටත් බොහෝ කෙලෙසුන් ගෙවා සෝවාන් වීමෙන් ආර්ය ජාතියෙහි පිහිටා ජාතින් ශුද්ධ කළහ. සංසාර දෝෂය නිසා ඇති නුගුණත් හළහ. නටුවා වූ ලොවීසැපතට ලොවුතුරාසැපතුත් යම්තම් විතරක් ලත්හ.

(i) පටාචාරාවන්ගේ ශෝකදුඃඛය තුනී වූයේ කෙබඳු ආකාරයෙන් ද?

(ii) ශෝකදුඃඛය තුනී වූ පසු බුදුන් වහන්සේ පටාචාරාවට කුමක් වදාළ සේක් ද?

(iii) පටාචාරා තම ජාතිය ශුද්ධ කර ගත්තේ කෙසේ ද?

(iv) **නටුවා වූ** හා **ලොවීසැපත** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(ආ) එකල්හි රජ කරන සොත්ථිසේන රජ්ජුරුවෝ තුමන් හා එක් ව දුක් ගෙන ඇවිදි සම්බුලාවන්ට අග මෙහෙසුන් තනතුරු පමණක් දී සෙසු නිසි වෘත්තියක් නුදුන්නාහ. එකල්හි රජ්ජුරුවෝ බිසවුන් ඇති බවත් නො දැන සෙසු ස්ත්‍රීන් හා සමග සිත් අලවා කෙළිමින් සෙමින් අභිරමණය කොට ඇවිදිනාහ. සම්බුලාවෝ ද තමන් කෙරෙහි කිසි විචාරයක් නැති හෙයින් දවසින් දවස ලජ්ජාවෙන් හා සපත්නීරෝසයෙන් දුර්වල ව පඬුවන් සිරුරු ඇති ව ඉපිල හුණු නහර බහනින් වළඳන ලද ශරීරයක් ඇති ව වාසය කරන්නාහ. ශෝකයෙන් දුර්වල වූ ශරීර ඇති ඒ බිසවි එක් දවසෙක්හි රජ ගෙන් දන් අනුභව කරන්ට ආ මයිල් රජ්ජුරුවන් කරා ගොස් වැඳ එකත්පස් ව උන්නීය. එකල්හි තාපසයෝ ඉතා ම දුර්වල ව ශරීරයක් ඇති මිරිකුණා වූ චක්ෂුරාදී ඉඳුරන් ඇති බිසවුන් දැක, දුර්වල වූ කාරණා විචාරන්නා ව මෙසේ කියත්.

(i) සොත්ථිසේන රජ තමන් හා එක්ව දුක්ගෙන ඇවිදි සම්බුලාවන්ට කෘතගුණ දැක්වූයේ කෙසේ ද?

(ii) බිසව ශෝකයෙන් දුර්වල වූයේ ඇයි?

(iii) රජතුමා සෙසු ස්ත්‍රීන් සමග සිත් අලවා විසීම කතුවරයා ඉදිරිපත් කරන්නේ කෙබඳු ආකාරයෙන් ද?

(iv) **මයිල්** හා **ඉඳුරන්** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



(ඉ) මෙසේ ඒ සොරා ගම මුළුල්ලෙහි ඇවිද එක තැනෙකත් පිටිවහලක් නො ලැබ තෙරුන්වහන්සේගේ සමීපයට ම යෙමි යි සිතා විහාරයට ගොස් "ස්වාමීනි, ගැත්තවුට පිටිවහල් වුව මැනව, මේ පිට බැඳි මළ මිනිය උනා හැර මා සුවපත් කළ මැනවැ"යි කීය. තෙරුන්වහන්සේ ඔහු දැක කම්පා ව ළය පිරුණු ශෝක ඇති ව වහා හුනස්නෙන් නැඟී ඔහු සමීපයට එළඹ පිට බැඳි මළ මිනිය උනා ගෙන ගොස් දුර දමා ඔහු උණු පැනින් නහවා කුලාවෙන් තෙල් ගෙන සකල ශරීරය තෙල් ගල්වා මුගුරෙන් පහළ තැන් තවමින් උන් කල්හි ඕහට බැටදුන් උපාසකයා උදැසන්හි ම සොරා කොයි ගියේ දෝ හොයි විචාර විචාරා සොයා ඇවිදුනේ විහාරයට ගොස් සොරා පිට තෙල් ගා තවමින් උන් තෙරුන්වහන්සේ දැක ඔබ හා සමග කථා කරන්නා වූ උපාසක තෙම,

(i) සොරා විහාරයට ම ගියේ ඇයි?
(ii) විහාරයට පැමිණි සොරා තෙරුන්වහන්සේට කුමක් පැවසුවේ ද?
(iii) විහාරයට ගිය උපාසකයාට දක්නට ලැබුණේ කුමක් ද?
(iv) **පිටිවහලක්** හා **උනා ගෙන** යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

(ඊ)
නොසී කරන මිසදිටුවන් බස අබඳ
නි සී නැණැති සිරි පැරකුම් රජුට නඳ
ර සී ගැඹුරු තෙපලෙන් සැක සිත පසිඳ
දෙ සී සුවාසූ දහසක් දහම් කඳ

එ හිමි කෙලෙස් ගිරි මුදුනින් වැහෙන සොඳ
දහම් අහස් ගඟ දුල දිය දහර වැද
නොමඳ සතොස් අම ඔදසින් පිරි නිබඳ
බැබැළි වෙසෙස් නරනිඳු සඳ කිරි මුහුද

(i) පැරකුම් රජතුමාට නිසී නැණ ඇතැයි කවියා පවසන්නේ කුමක් නිසා ද?
(ii) නරනිඳු සඳ කිරි මුහුද වෙසෙසින් බැබළුණේ ඇයි?
(iii) 'දහම් අහස් ගඟ' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.
(iv) **සුවාසූ දහසක් දහම් කඳ** යන්නෙහි අර්ථය පහදා දෙන්න. (ලකුණු 04 යි.)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) "සෙසු වුවමනා දවස් නැති හෙයින් අදම වුවමනා ද?"
(ii) "ස්වප්නයෙන් දැකීම් වශයෙන් මහත් දොළක් උපන්නේ ය."
(iii) "ඒ ගමන තොප දක්නා පිණිස එන ගමනකැයි සිතමි."
(iv) "අපේ ගෙවල් ඔක්කොම පිළිස්සුණා යුද්දෙදි"
(v) "රජතුමනි කලබල වෙන්ඩ එපා"
(vi) "ගුණවතී .... ලොකු පුතා ද කෙදිරි ගෑවේ?" (ලකුණු 08 යි.)

(ඌ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පරපුරක කළු දුඹුල් කඩා පිරිසුදු කරන
සෙවෙල කෑ උළු පිහිලි සෝද සෝදා හරින
අලුත් වැස්සක අසිරි පතා සිටියෙන් නිතින
මෙන්න දැන් දොරකඩට ඇවිත් නිල් දිය ඉසින

ඇදුරු වුණු දොර ජනෙල මානයේ උණුසුමින
සුව සිහිල නිදහසේ උරා බී සැප විඳින
ලෝකයේ පුස්ඹ පිරී තිරෙන ලෙස විවර වුණ
වලවුවට සිවු දිගින් සුළං රැළි විත් නටන

අලුත් වැස්සෙන් පෙඟුණු පින්තූරයෙන් එබෙන
රත් යවට සේ දැවෙන තාත්තාගෙ නෙත් වලින
දීප්තිය නිවී සේදී දූකට කඳුළු එන
රාමුවෙන් බිඳෙන් බිඳ පතිත වී ලිහී යන

[තුන්වැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



ඇතුළු ගැබ නොදුටු අහුමුලු සොයා හඹායන
අලුත් වැහි හැළි වළං උතුරුවා ඇද වැටෙන
මහා පෙට්ටගම 'හායි' ගා මහලු කට අරින
අවලංගු ඔප්පුවල අකුරු බොඳ වී මැකෙන

බමුණු මහසල් කුලයෙ රස්නයෙන් ඉරි තැළුණ
මාන්දම් බිත්ති බඩ නෙරා කොරපොතු ඉහෙන
ලොවට දුන් ගිනි ම යළි ගෙබිම ගිනියම් කරන
අලුත් වැස්සෙන් එගිනි නිවි නිවී සංසිඳෙන

එදා දස දිගින් වැඩි සුළඟට ද වැසූ දොරින
ඇතුළු වෙයි ගැමි දනන්ගේ වේදනා මුහුණ
වලවුවේ වියගසින් මිදී රිසි සේ හාන
ගොවි පුතුන් මඩ නාන්නට මටත් අත වනන (ලකුණු 16 යි.)

**2.** කථා රසය උද්දීපනය කිරීමෙහි ලා **සද්ධර්ම රත්නාවලී** කතුවරයා උපමා භාවිත කොට ඇති ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

"අතීත හා වර්තමාන කථා ඇතුළත් හේතු-ඵලවාදී කථා සම්ප්‍රදාය ජාතක කථාවලට අගනා සන්දර්භයක් ගෙන දෙයි." නියමිත කථා වස්තු ඇසුරෙන් පිරික්සන්න. (ලකුණු 15 යි.)

**3.** "පුණ්‍ය ශක්තියට හා ආත්ම දමනයට අනුරූප ව පුද්ගලයාගේ මෙලොව හා පරලොව ජීවිත හැඩ ගැසෙයි." **සද්ධර්මාලංකාරයේ** නියමිත කථා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**4.** "රස නිෂ්පත්තියට යෝග්‍ය ආකාරයෙන් තෝරාගත් වර්ණනා කලාත්මක ව ඉදිරිපත් කිරීම නිසා **ගිරා සන්දේශය** සහෘදයාගේ සිත් ඇද ගනී." වර්ණනා **දෙකක් වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**5.** "ලෝකයේ පවත්නා දේශ සීමා හෝ වාර්ගික ප්‍රශ්න හෝ මගින් ස්ත්‍රී පුරුෂයන් අතර ඇති වන ප්‍රේම සම්බන්ධතාවන්ට බාධාවක් ඇති නො වේ. එහෙත් ගැටලු පැන නගින්නේ විවාහය පිළිබඳ ප්‍රශ්නයේ දී ය." **මළගිය ඇත්තෝ** නවකතාව ඇසුරෙන් මේ මතය විභාග කරන්න. (ලකුණු 15 යි.)

**6.** **මාවතේ දරුවෝ** කෙටිකතාව මගින් දයාසේන ගුණසිංහ කාලීන සමාජ යථාර්ථය හෙළි කිරීමට දැරූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී දැයි විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

**7.** "කොළඹ යුගයේ ආරම්භක කවීන්ගේ එක් ප්‍රධාන පරමාර්ථයක් වූයේ තම සහෘදයන් ජාතිකාභිමානයෙන් ඔදවත් කිරීම යි." කවීන් **දෙදෙනකුගේ** පද්‍ය නිර්මාණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**8.** පැරණි භාරතීය ප්‍රභූ සමාජයේ දුර්වලතා කලාත්මක ව නිරූපණය කිරීමෙහි ලා **රත්නාවලී** නාට්‍යයේ කතුවරයා දරන ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වී දැයි නිදසුන් සහිත ව විමසන්න. (ලකුණු 15 යි.)

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

agaram.lk

www.agaram.lk

90016

AL/2018/71/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

2018.08.14 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..........................

**උපදෙස්:**

* **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. **අඝෝෂාක්ෂර** පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ක, ච, ට, ත, ප, ස
(2) ග, ඝ, ජ, ඣ, ද, ධ
(3) ඛ, ඤ, ණ, න, ම, ස
(4) ය, ර, ල, ව, ශ, ෂ
(5) ඝ, ඣ, ඪ, ධ, හ, ක (......)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) විමර්ශණය, කණාමැදිරි, ලතැවිල්ල, තුෂ්ණීම්භූත, කාළගුණය
(2) විමර්ශනය, කණාමැදිරි, ළතැවිල්ල, තුෂ්ණීම්භූත, කාලගුණය
(3) විමර්ශනය, කනාමැදිරි, ළතැවිල්ල, තුශ්ණීම්භූත, කාලගුණය
(4) විමර්ෂණය, කණාමැදිරි, ලතැවිල්ළ, තුස්ණීම්බූත, කාළගුණය
(5) විමර්ෂනය, කනාමැදිරි, ලතැවිල්ල, තුෂ්ණීම්භූත, කාලගුණය (......)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) අලියා, මුවා, සිංහයා, මුගටියා
(2) හාවා, වලහා, ව්‍යාඝ්‍රයා, ඌරා
(3) ගොනා, හිවලා, උගුඩුවා, කටුස්සා
(4) බළලා, බූරුවා, රිළවා, වඳුරා
(5) මීයා, අශ්වයා, බල්ලා, කොටියා (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.
(1) 'ෙ' යනු 'එ' යන්න නියෝජනය කරන පිල්ලම යි.
(2) 'ඓතිහාසික' යනුවෙන් කොම්බු දෙක සහිත ව ලිවීම නිරවද්‍ය ය.
(3) ව්‍යඤ්ජනයක් සමඟ මෙන් ම ස්වරයක් සමඟ ද කොම්බු දෙක යෙදේ.
(4) සම්භාව්‍ය ගද්‍ය රචනාවන්හි 'ඓ' යන්න වෙනුවට 'අයි' යන්න ද භාවිත වේ.
(5) 'ඓ' යනු 'අ + එ' යන අක්ෂර සන්ධි වීමෙන් සැකසුණු අකුරකි. (......)

1.5. **යංශය, රේඵය, රකාරාංශය** හා **ගයනුකිත්ත** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) නාට්‍ය, ගර්ව, සංක්‍රමණ, චෞර
(2) වාක්‍ය, ප්‍රතාප, මෞර්ය, නිර්මාණ
(3) වර්ග, ක්‍රීඩා, වාච්‍ය, රෞරව
(4) ප්‍රධාන, දිව්‍ය, තර්ක, ශෞර්ය
(5) කෞතුක, ප්‍රමාණ, දුර්ග, නිත්‍ය (......)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) ආගමික සහජීවනය, වෛද්‍ය උපාධිය, අසල්වැසි රාජ්‍යය, විධායක ජනාධිපති
(2) වීර කාව්‍යය, ජාතික අනුරාගය, අශ්ව රථය, මානව හිමිකම්
(3) ධාවන පථය, කඳු තරණය, චිත්‍ර කලාව, තාරකා විද්‍යාව
(4) ජංගම සේවාව, සිප් සතර, රාත්‍රි භෝජනය, මඟුල් නැකත
(5) මහ මඟ, ව්‍යවස්ථා සංශෝධනය, මිනිස් ශරීරය, ස්වර්ග සම්පත්ති (......)

[දෙවැනි පිටුව බලන්න.

agaram.lk

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) පාලක, ආචාර්ය, වාහන, පරණ (2) චතුර, අංක, නාග, වංක
(3) ආකර, දේව, හම, සමණ (4) විකාර, බාලක, නිවාස, මිතු
(5) සකල, කෝප, රාග, සග (......)

1.8. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අවසාන - අනන්ත, අනවසාන, මුල, ආරම්භය
(2) කනිෂ්ඨ - ජ්‍යෙෂ්ඨ, මහලු, වෘද්ධ, වයසක
(3) අවුල් - නිරවුල්, ව්‍යාකුල, පැහැදිලි, නිරාකුල
(4) කෲර - ශාන්ත, දැමුණු, සංවර, සන්සුන්
(5) ශබ්ද - නිහඬ, නිශ්ශබ්ද, නිශ්චල, නිසංසල (......)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) මාර්ගය - පාර, මඟ, පථය, වීථිය (2) වස්ත්‍රය - රෙද්ද, වත, සළුව, සාටකය
(3) හිස - ශීර්ෂය, ඔළුව, මුදුන, සිරස (4) පර්වතය - ගිරි, පව්ව, කන්ද, අචල
(5) හස්තය - බාහුව, කර, අත, අල්ල (......)

1.10. **අවදි, අදර, සපදන්** හා **සබඳ** යන **විභක්ති සමාස** පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) විදේශාධාර, අතදරුවා, දේවපූජාව, කුරුලුගීත
(2) දේවපූජාව, විදේශාධාර, අතදරුවා, කුරුලුගීත
(3) අතදරුවා, කුරුලුගීත, දේවපූජාව, විදේශාධාර
(4) විදේශාධාර, දේව පූජාව, කුරුලුගීත, අතදරුවා
(5) කුරුලුගීත, අතදරුවා, විදේශාධාර, දේවපූජාව (......)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) විසිරුම්, ඇසිරුම්, ඉසිරුම්, හැසිරුම් (2) උතුළ, වපුළ, අතුළ, හළ
(3) වැසිලි, බැසිලි, කිසිලි, නැසිලි (4) ලිඛිත, සංශෝධිත, රචිත, දේශිත
(5) පාරන, ආරන, මෝරන, සූරන (......)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) '**එන්න** මද නලේ ....' (ආ) 'කෙත් වත් සාර **වේවා**!'
(ඉ) 'රොන් **අරගෙන** සෙමින්' (ඊ) '**කියමින්** සොඳ ගී සින්දු'
(1) ආශීර්වාදක්‍රියා, විධික්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා (2) විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා
(3) මිශ්‍රක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා (4) විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා
(5) ආශීර්වාදක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා (......)

1.13. **උක්ත පද දෙකක්** හා **අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) පාලකයන්, වටුවකු, හෙදියක, ගෙම්බෝ (2) සිවුපාවෙක්, ගොවියකු, තරුණයන්, බැතිමතෙක්
(3) උපාසිකාවන්, වෙළෙන්දෝ, නරියෙක්, අපි (4) රචකයකු, නිරිඳෙක්, කපටියකු, නෑයකු
(5) ලේඛිකාවක්, වඬුරකු, නැණවතෙක්, වැසියෙක් (......)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) අවමංගල, අවභාවිත, අවනීති, අවපීඩන (2) අනුමෝදනා, අනුකම්පා, අනුමාන, අනුවේදන
(3) විගමන, විදුර, විශුද්ධි, විදේශ (4) දුලද, දුමන, දුසිල්, දුගුණ
(5) නිර්වින්දන, නිර්ලජ්ජිත, නිර්දෝෂ, නිර්මාංස (......)

1.15. "සද්ධර්ම **රත්නාවලිය** වනාහි ධර්මසේන හිමියන් විසින් **රචිත ප්‍රබන්ධයකි.**" යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) කෘදන්ත, සමාස හා සන්ධි (2) සමාස, සන්ධි හා කෘදන්ත
(3) සන්ධි, සමාස හා කෘදන්ත (4) කෘදන්ත, සන්ධි හා සමාස
(5) සන්ධි, කෘදන්ත හා සමාස (......)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) තල්ලරඹ, කොස්සැට, රුක්කත්තන, කරුමක්කාර
(2) ළමාලෝකය, වැදිබණ, ශාක්‍යවංශය, යක්ෂවිමානය
(3) දම-දමා, කපා-කපා, හාර-හාරා, ලිය-ලියා
(4) පැසසිණි, ලියැවිණි, බැලිණි, කැපිණි
(5) දිරිමත්, රුමත්, අසිරිමත්, ඉසුරුමත් (......)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.
(1) යකඩදම්වැල්, ගල්පඩි, කොහුලනු, පුහුල්දෝසි
(2) මුහුණත, දකුණත, නිලුපුල්, මැදැඟිල්ල
(3) නිවැරදි, නිකැලැල්, නිහඬ, නිදොස්
(4) දෙමහල්, සිවුපද, සතරවාසල්, දෙතිස්වද
(5) නගරසභාව, වනබඹරා, දොරගුළු, විදෙස්පුවත් (......)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) සමුද්‍රාසන්න, හස්ත්‍යාභරණ, ස්වදේශාලය, පද්මාකර
(2) මිගිඳු, ගුරුළිඳු, මුනිඳු, රජිඳු
(3) ජාත්‍යභිමානය, රත්‍යුත්සව, නීත්‍යුපදේශ, අත්‍යාසන්න
(4) බලැති, නැණැති, විකුමැති, රුවැති
(5) අද්දැකීම, අස්සන, රද්දැල්ලො, පත්තිරු (......)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වැකිය** තෝරන්න.
(1) පත්තරකරුවෝ අසත්‍ය පතුරවති'යි පාලකයෝ දෝෂාරෝපණය කරති.
(2) ප්‍රකට විද්වතකු වූ ඩී. බී. ජයතිලක කීර්තිමත් ජාතික නායකයෙක් ද විය.
(3) මෙය ආබාධිත දරුවෝ උදෙසා පරිත්‍යාග කරන ලද රෝද පුටුවකි.
(4) අපගේ දරුවන් විභාගයෙන් ජය ගනිත්වා!
(5) මාර්ටින් වික්‍රමසිංහයන් විසින් විවිධ ග්‍රන්ථයන් රචනා කරන ලදි. (......)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) එතුමා බලියා ගත් බෙර වාදන යත් උගත්තේ ය.
(2) කාව්‍ය සාහිත්‍ය විෂයයෙහිලා පුරාතන විද්වතුන්ගේ සම් ප්‍රදානය අත්‍යධික ය.
(3) ගුණවත් හා නැණවත් මිනිසුන්ට ගරු බුහුමන් දැක්වී ම අපක්ෂපාතීවත් ක්‍රමානුකූලවත් කළ යුතු ය.
(4) විද්‍යාචක්‍රවර්තීන් ගේ බුත් සරණ වනා හි ප්‍රකට භක්ති කාව්‍යයකි.
(5) ඔහු ශාස්ත්‍රවේදී හා විද්‍යාවේදී යන උපාධි දෙක ම දිනා ගත්තේ ය. (......)

(ලකුණු 20 යි.)

* *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

89989



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිස් ශ්‍රමශක්තිය දියුණු කිරීම සහ උපයෝජනය පිළිබඳ සියලු ම මූලික ක්‍රියාවලීන්හි පදනම වනුයේ අධ්‍යාපනය යි. අධ්‍යාපනය මිනිස් ශ්‍රමශක්ති ඉල්ලුමෙහි සහ සැපයුමෙහි වර්ධනයට ඉවහල් වන ක්‍රම විවිධ මෙන් ම සංකීර්ණ ය. පුහුණු කළ හැකි නව මිනිස් ශ්‍රමය ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා පුහුණු කිරීමෙහි ලා අධ්‍යාපනය සතුව ඇත්තේ ඍජු කාර්යයකි. එමගින් මිනිස් ශ්‍රමශක්තිය මෙහෙයවීමෙහි සහ පතුරුවාලීමෙහි මෙන් ම නිපුණතාවන් ලබා ගැනීමෙහි ලා වූ මූලික පෙලඹීම් සාධක ක්‍රියාත්මක කෙරේ. අන් සෑම කරුණකට ම වඩා එමගින් මිනිස් විචල්‍යයන් ක්‍රියාත්මක ව සංස්කෘතික සහ සමාජ සැකැස්ම සැපයේ.

පොදු අධ්‍යාපන ක්‍රමයක් සතු කාර්යය ඒ ඒ පුද්ගලයන් විශේෂිත රැකියා අවශ්‍යතාවන් සඳහා යොදා ගත හැකි මෙන් ම 'පුහුණු කළ හැකි' බවට පත් කරන මූලික අධ්‍යාපනික පසුබිමක් ඔවුනට ලබා දීම යි. ප්‍රාථමික අධ්‍යාපන තත්ත්වයේ දී පිළිබිඹු වන මෙම ප්‍රවීණතාව වුකලී අකුරු දැනීමෙහි වැඩි දියුණුව සඳහා වූ වෙනස පිළිබඳ අවබෝධයෙහි ප්‍රතිඵලය යි. ඇතැම් පර්යේෂකයන් විසින් මූලික අධ්‍යාපන මට්ටම් සහ ආර්ථික සංවර්ධන දර්ශකයන් අතර නියත අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ඇති බව පෙන්වා දී තිබේ. ද්විතීයික මට්ටමේ දී අධ්‍යාපනය, ලිපිකාර සහ අලෙවි කටයුතුවල නියුක්තවූවන් සහ ගුරුවරුන් යනාදි විශාල පුද්ගල සංඛ්‍යාවක් ඇතුළු පුහුණු කළ හැකි නා නා මාදිලියේ ශ්‍රමිකයන් බිහි කිරීමට ඉවහල් වනු පමණක් නොව, එහි අන්තර්ගත වෘත්තීය සහ විවිධීකෘත අංශ මගින්, නොයෙක් ශිල්පීන්ටත් පහළ ශ්‍රේණිවල පරිපාලකයන්ටත් අවශ්‍ය මූලික දැනුම ලබා දෙයි. පැහැදිලි වශයෙන් ම මධ්‍ය සහ ඉහළ අධ්‍යාපන මට්ටම්වල දී කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සතු මිනිස් ශ්‍රමශක්ති සම්පාදන කාර්යය වනුයේ ආර්ථික ක්‍රමයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, කාර්මික විද්‍යාඥයන් සහ පර්යේෂකයන් බිහි කිරීම යි. උසස් අධ්‍යාපනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රටෙහි ප්‍රභූ පිරිස එනම් නානාවිධ කාර්ය ක්ෂේත්‍රයන්හි නියුක්ත නායක සහ උසස් පරිපාලක සංඛ්‍යාව වැඩි වේ. මෙපරිද්දෙන්, සෑම මට්ටමක දී ම, අධ්‍යාපනික අවස්ථා, සමාජ සහ ආර්ථික සංවර්ධන අවශ්‍යතාවට සීමා නොකොට ම ඒ හා සම්බන්ධ කර ලීම වැදගත් බව පැහැදිලි ය.

(i) අධ්‍යාපනය සතුව ඇති ඍජු කාර්යභාරයක් වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(ii) මූලික අධ්‍යාපන පසුබිම යනුවෙන් මේ ලේඛකයා හඳුන්වන්නේ කුමක් ද?

(iii) ඇතැම් පර්යේෂකයන් විසින් දක්වනු ලැබ ඇති ආකාරයට අධ්‍යාපන මට්ටම් සහ ආර්ථික සංවර්ධන දර්ශකයන් අතර පවතින්නේ කෙබඳු සබඳතාවක් ද?

(iv) මධ්‍ය හා ඉහළ අධ්‍යාපන මට්ටම්වල දී කාර්මික සහ වෘත්තීය අධ්‍යාපනය සතු මිනිස් ශ්‍රමශක්ති සම්පාදන කාර්යය කුමක් ද?

(v) උසස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙස ලේඛකයා දක්වන්නේ කුමක් ද? (ලකුණු 10 යි.)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

agaram.lk

www.agaram.lk



(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අද බලවත් ම සමාජ ආයාචනය බවට පත්ව ඇත්තේ සමාජීය හා පාරිසරික මිනිසකු තැනීම හෙවත් තිරසර සංවර්ධනය සඳහා මානවයා සූදානම් කිරීම බව පැවසේ. එක්සත් ජාතීන් විසින් දස වසරින් දස වසර ලෝක සංවර්ධනයට තේමාවක් ලබා දෙන ලදි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන දශකවලින් විස්තර වන පරිදි 90 දශකයේ ලෝක සංවර්ධන උපාය මාර්ගවල එක් ප්‍රධාන ක්‍රමෝපායක් වූයේ තිරසර සංවර්ධනය කරා යන ගමන සඳහා ලෝක ජනතාව සූදානම් කිරීමේ කාර්යභාරය ඒ ඒ රටවලට පවරමින් තම සහාය ද ප්‍රදානය කිරීම යි.

සංවර්ධනය, මානව හා පරිසර කේන්ද්‍රීය ම වෙයි. ඒ අනුව මානව සුබසාධනය ද පරිසර සුබසාධනය (සංරක්ෂණය) ද වැදගති. එයින් පෙනෙන්නේ පරිසරය සුරක්ෂණය කිරීම අවසාන වශයෙන් මානවයාගේ පැවැත්ම සනාථ කරන බව යි. ඒ අනුව සංවර්ධනයේ පරම අරමුණ මිනිසාගේ සුබසාධනය නම් 'පරම සම්පත' ද මිනිසා ම වනු නියති. එහි අනෙක් අන්තය නම් මිනිස් සම්පත සතු පරම සම්පත පරිසරය බව යි.

පාරිසරික වශයෙන් තිරසර වූත්, ආර්ථික වශයෙන් පවත්වා ගෙන යා හැකි වූත් සමාජීය වශයෙන් සර්ව සාධාරණ වූත් සංවර්ධනයක් ලබා ගත හැක්කේ මිනිසා තුළින් ම නම් මිනිසා තැනීම හැර අන් කාර්යයක් ලෝක ජනතාවට නැත. ජගත් සංවිධානවලට නැත. සැබවින් ම ඒ කවරකට වුව එම අදහසින් මිදිය හැකි ද නොහේ.

මානව සම්පත් සංවර්ධනය යනු විසින් අර්ථ ප්‍රමාණික කරනු ලබන්නේ පාරිසරික, ආර්ථික, සාමාජික හා දේශපාලනික වශයෙන් ඇති වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි ලෝක ජනතාවක්, ලෝක ජන සමාජයක් බිහි කිරීම යි. (ලකුණු 15 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන දිරිමත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

(ii) ලෝක බලවතුන්ගේ මූල්‍ය අර්බුදය නිසා ගෝලීය ප්‍රජාව මුහුණ පාන අභියෝග

(iii) රුපියල අවප්‍රමාණය වීම මගින් මෙරට ආර්ථිකය කෙරෙහි ඇති වන බලපෑම

(iv) රටක සංහිඳියාව උදෙසා සංස්කෘතික උත්සව මගින් ලැබෙන දායකත්වය

(v) ප්‍රමාණාත්මක භාවයෙන් මෙන් ම ගුණාත්මක භාවයෙන් ද අධ්‍යාපනය අනූන විය යුතු ය.

(vi) සිංහල සිනමාව ජාත්‍යන්තර තලයට ගෙන ඒමේ අවශ්‍යතාව (ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) සිරකරුවන් මනුෂ්‍යයෝ වෙති.

(ii) රජය විසින් නාවික හමුදාවට නවක සෙබළුන් බඳවා ගැනෙති.

(iii) මහනාහිමියන් කුලපති ධූරයෙන් පිදුම් ලැබූහ.

(iv) මැන්ඩිස් ගුණසේකර මුදලිතුමාණෝ භාෂා පරිවර්තකයකු මෙන් ම සාහිත්‍යධරයෙක් ද වූහ.

(v) ප්‍රවීණ ලේඛකයකු වූ ඇරැව්වල නන්දිමිත්‍රයන් නොබෝදා දැයෙන් සමු ගත්හ. (ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) ඇමතිතුමා සාහිත්‍යධරයන් අගය කරයි.

(ii) පක්ෂ ලේකම්වරු නගරසභාවලට අපේක්ෂකයන් නම් කළහ.

(iii) ආරක්ෂක භටයෝ නගරයේ දී අප පරීක්ෂා කළහ.

(iv) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අපිරිසිදු ආපණශාලා හිමිකරුවන් අධිකරණයට ඉදිරිපත් කරති.

(v) විභාගය උසස් ලෙස සමත් වීමෙන් පසු ගුරුවරු මා පැසසූහ. (ලකුණු 05 යි.)

(ඉ) **නිවැරදි වැකියක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) වාග්විද්‍යාඥයෝ නව භාෂා (රීතීන්/රීතීහු) විග්‍රහ කරති.

(ii) ඇමතිතුමා ශිෂ්‍යත්වලාභීන් කොළඹට (කැඳවයි/කැඳවති).

(iii) (දරුවෝ/දරුවන්) වියපත් වූ පියාණන් රැකබලා ගනිති.

(iv) ගුරුළුගෝමී විසින් ධර්මප්‍රදීපිකාව රචනා (කරන ලදි/කරනු ලබයි).

(v) (කිඹුලෝ/කිඹුලන්) ගම් වදිති'යි ගැමියෝ බියෙන් පසු වෙති. (ලකුණු 05 යි.)

agaram.lk



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) ජාතීන් අතර **අන්‍යෝන්‍ය** අවබෝධය ඉතා අගනේ ය.

(ii) අධිකරණය **චූදිතයා** නිදහස් කරයි.

(iii) චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යයේ **දුරවබෝධ** පද නිතර හමු වෙයි. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) විද්‍යාව දැනගත් පුද්ගලයා

(ii) කෘතියක ගැටලු සහිත පද පහදා දෙන සාහිත්‍ය ග්‍රන්ථ

(iii) විචාර බුද්ධියෙන් තොරව කිසියම් මතයක එල්බ ගැනීම (ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) ඩෙංගු රෝගය මැඩීම සඳහා පාසල් ...................... පිරිසිදු ව තබා ගත යුතු ය.

(ii) අඩු මිල විදුලි ...................... නිෂ්පාදනයෙන් චීනය ඉදිරියෙන් සිටී.

(iii) අනුරාධපුර නගරයේ දී ගොවි ...................... පැවැත්විණි.

(iv) වීරෝදාර සෙබළු යුද්ධ ...................... වෙත අවතීර්ණ වූහ.

(v) ලෝක සාමය පිළිබඳ ජාත්‍යන්තර ...................... ජිනීවාහි දී පැවැත්වේ.

(vi) තාක්ෂණික ...................... මිනිසාගේ බුද්ධිබලය හීන කරයි.

(මෙවලම්, බිම, සම්මන්ත්‍රණය, භූමිය, සමුළුව, උපකරණ) (ලකුණු 03 යි.)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) භාණ්ඩයක **කල්** පැවැත්ම කෙරෙහි කවුරුත් අවධානය යොමු කරති.

(ii) **ලද** යන්නෙහි ලැබූ අර්ථය ඇත.

(iii) ඔහු සභික ධුරයකට **පත්** කෙරෙයි.

(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.

(v) සොරා **පැන** දුවයි.

(vi) යුද්ධය නිසා බොහෝ දරුවන්ට **පිය** සෙනෙහස අහිමි විය. (ලකුණු 06 යි.)

**6.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ** අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු අංගය** දක්වන්න.

(i) ප්‍රියයාගේ **වියෝගය** දරනු නොහැකි ව **මුවගන** තම නුවනත කඳුළින් පුරවා ගත්තා ය. (**වියෝගය** - උපසර්ග, **මුවගන** - සන්ධි, **නුවනත** - තද්ධිත)

(ii) වැද්දා **ඔබ්නොබ සරන වනසතුන්** ඉලක්ක කර හීයක් විද්දේ ය. (**ඔබ්නොබ** - සන්ධි, **සරන** - කෘදන්ත, **වනසතුන්** - සමාස)

(iii) **ජ්‍යෙෂ්ඨ** ශිෂ්‍යයන්ගේ නොමනා ක්‍රියා නිසා ඇතැම් **නවක ශිෂ්‍යයෝ** සරසවිය අත් **හැර** යති. (**ජ්‍යෙෂ්ඨ** - තද්ධිත, **නවක ශිෂ්‍යයෝ** - සමාස, **හැර** - ක්‍රියා)

(iv) **සුරාසුර යුද්ධයෙහි** දී පරාජය වූවෝ **දෙව්ලොව** හැර පලා ගියහ. (**සුරාසුර** - සන්ධි, **යුද්ධයෙහි** - විභක්ති, **දෙව්ලොව** - සමාස)

(v) "**අනේ!** එ විපත සිදු වුණි. නො **දනිමි කාගෙ** දොසා" (**අනේ** - නිපාත, **දනිමි** - ක්‍රියා, **කාගෙ** - විභක්ති) (ලකුණු 15 යි.)

**7.** (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) වැරදි කරන්නා කාටත් වැරදි කරයි.

(ii) තනතුරට වඩා හැසිරෙන ආකාරය වෙලාවක දී වටින්නේ ය.

(iii) තමාගේ දියුණුව තමා ම සලසා ගන්න.

(iv) වැඩ දෙකක් ම එකවර කර ගැනීම

(v) යහපත් දේ කළත් නපුරු මිනිසා යහපත් ගති ඇත්තෙකු නොවීම

(vi) කෙනෙකුගේ ගති ගුණ වෙනස් කළ නොහැකි වීම (ලකුණු 03 යි.)

[හත්වැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



(ආ) පහත දී ඇති **රූඪීවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) අමු කැවිලා (ii) අං මතුවෙලා

(iii) දෝරේ යනවා (iv) වැදි බණ

(v) දෙකට දෙවාරම් (vi) අකලට මෝරලා (ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පදය සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) දිග - පළල (ii) වං - හුං

(iii) බැළ - මෙහෙවර (iv) හයි - හක්තිය

(v) හැල - හැප්පුම් (vi) දෙගුණ - තෙගුණ (ලකුණු 03 යි.)

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) දිය කැට පහණ (ii) කෝණම

(iii) තිහව (iv) පිරිවැස්ස

(v) ඇන්න යනවා (vi) රෑනා (ලකුණු 03 යි.)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) තෙත්තෙ (ii) දහ අට හොඳයි

(iii) මුදුනා (iv) පුබ්බරු

(v) බය්යනවා (vi) දෙයියන්ගේ බෝව (ලකුණු 03 යි.)

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චිත්‍රාකුමරියරූපයෙන්අග්‍රප්‍රාප්තයසියලුස්ත්‍රීමායමින්පාරප්‍රාප්තයමදමුදුලලිතභාෂණයෙන්දනෙත්කොන්බැල්මහාමුසුවූමන්දස්මිතයෙන්දයෞවනයන්උන්මාදයටපත්කරනහෙයින්ඈඋන්මාදචිත්‍රානම්වූවායනෛමිත්තිකයන්ගේඅනාවැකිඅසාභීතියටපත්දෙමවුපියන්විසින්ඈඑක්ටැම්ගෙයකසිරකරනුලැබූවායඅහෝඈදුක්මුසුවඑහිහුදකලාවදිවිගෙවූවායඑකලගාමිණීනම්වූඅභිරූපසම්පන්නයෞවනයෙක්වූයේයඋත්තුංගදේහධාරියකුවූහෙයින්හෙතෙමදීඝගාමිණීනම්වීයදෛවෝපගතවමෙන්ඔවුන්දෙදෙනාඅතරප්‍රේමසම්බන්ධයක්ඇතිවියමාප්‍රේමියකෙදිනකහෝඔබමාගේපාදපරිචාරිකාවකරගනිමියිඔහුඇයටපොරොන්දුවූයේයමාපෙම්බරකුමරාණමාගේඒකායනප්‍රාර්ථනයදඑයමුත්මමමේසිරකුටියෙන්කෙසේමිදෙම්දැයිඇශෝකයෙන්බරවවිචාළායසොඳුරියමමඔබදකිනුපිණිසහැකිවිගසින්එන්නෙමියිකියාඔහුඇයගේදර්ශනපථයෙන්ඉවත්වගියේයදිනසතිමාසගෙවීගියේයවසන්තකාලයදඋදාවියපූර්ණචන්ද්‍රයානභෝතලයශෝභාවත්කෙළේයපුලපුලාබලාසිටිරූපකායඇයඇස්මානයේපෙනීසිටියේයමුරසේවිකාවක්අදරාත්‍රියේකුමරුන්ඔබවෙතඑතියිදැනුම්දුන්නායඔහුකක්කටකයන්ත්‍රයකකකුළුවකුගේආකාරයෙන්තැනූයන්ත්‍රයකආධාරයෙන්එක්ටැම්කුලුනනැග්ගේයසඳවරින්වරවලාකුළුඅතරසැඟවගියේයඅරුණෝදයේළාහිරුරැස්ඔවුනගේකුටියආලෝකවත්කෙළේයඇහඬමින්මඳසුසුම්හෙළමින්නෙතුකඳුළින්පුරමින්ඔහුටසමුදුන්නාය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **ගෞරවාර්ථ ප්‍රත්‍යයයක්** සහිත ආමන්ත්‍රණ පදයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iii) **'ක'** වර්ගයට අයත් **ඝෝෂ මහාප්‍රාණ** අක්ෂරයක් සහිත පදය උපුටා ලියන්න.

(iv) **අස්ත්‍යර්ථයේ තද්ධිත** ප්‍රත්‍යය සහිත පද **දෙකක්** ඡේදයෙන් තෝරා ලියන්න.

(v) **දේහධාරියකු** යන්නෙහි ඇති පිල්ලම් නම් කරන්න.

(ලකුණු 15 යි.)

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk